# සමගියේ බලේ



සනුමි සහන්සා අබේසුන්දර

# සමගියේ බලේ

සනුම් සහන්සා අබේසුන්දර

කතාව සහ චිත්‍ර: සනුමි සහන්සා අබේසුන්දර

ISBN: 978-624-228-221-9

**පිදුම**

**හෙට ලොව**

**දිනන්නට**

**මා හට දිරිය දෙන**

**මව්පියන් ගුරුවරුන්**

**දෙපා වැඳ පුදන්නෙමි**

# පෙරවදන

සාහිත්‍යයේ දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යයමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදී කර්තෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන්වහන්සේට උපහාර පිණිස අතීත යතිවර සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් ම අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා ද අත්වැලක් වනු නො අනුමාන ය.

**ශශිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලික විද්‍යාලය
මහනුවර

ඔන්න එක ගෙදරක හිටියා පූස් පැටව් දෙදෙනෙක්. එක් කෙනෙක් කළු පූසි. අනෙකා සුදු පූසි. මේ දෙන්නගේ වැඩේ ම රණ්ඩු කරන එක.



ඔන්න එක දවසක් ඒ ගෙදර හිටපු පුංචි බබා වන ජෙනී පාසල් ගිහින් ඇවිත්, පූසි පැටව් දෙන්නා හිටපු කාමරේට ගියා. මුළු කාමරේ ම හැඩි කරලා. පුටු සූරලා. ඒ වගේ ම පූසි පැටව් දෙන්නා රණ්ඩු කරගෙන දෙන්නට ම තුවාලයි.



ඉතින් ජෙනී මේ දෙදෙනාට ම බෙහෙත් දැම්මා.



ඉන් පසුව ජෙනී සුදු පූසි ව සුරතල් කළා. ඒකට කළු පූසිට නම් හරි ම තරහයි.



පසුව ජෙනී පූසි පැටව් දෙදෙනාට කෑම ටික දීලා ඇය පාඩම් කරන්න ගියා.




ඇය පාඩම් කරන අතරතුර ඇයට ආපසු පූසි පැටව් රණ්ඩු කරනවා ඇහුනා. ගෙදර බඩුත් පෙරළනවා.

දඩාස්!



ඇය ඉක්මනට පූසි පැටව් දෙන්නා හිටපු කාමරයට දිව්වා. කෑම හැම තැන ම හලලා. ඇයට හිතා ගන්න බෑ. මොනවා කරන්නද කියලා. ඒ වගේ ම ඇයට හරි ම දුකයි.




ඉතින් ඔහොම කල්පනා කර කර ඉද්දී ඇයට උප්පරවැට්ටියක් මතක් වුණා.



පසු දින ජෙනී පාසල් යන්නට පෙර පූස් පැටව් දෙදෙනාට සෙල්ලම් කිරීමට වූල් බෝලයක් ලබා දුන්නා. ඉන් පසු ජෙනී පාසල් ගියා. ඒ අතරේ මේ පූසි පැටව් දෙදෙනා.අර වූල් බෝලය ඇගේ පටලවා ගෙන. ඉතින් පූසි පැටව් දෙන්නා එකතු වෙලා වූල් බෝලය ලිහා ගත්තා.



ඉතින් ඔහොම ගොඩ වෙලාවක් එකට ඉඳලා මේ පූස් පැටව් දෙන්නා යාළු වෙලා. ජෙනීට හරි ම සතුටුයි. ඒ වගේ ම ජෙනීට ඉබේ ම කියවුනා "දැක්කා නේද සමගියේ බලේ" කියලා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීමත් වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එක ම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහාමාය බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට මෙන් ම සමාජය තුළ විවිධ ගැටලු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

**සෙනෙවිරත්න මහලේකම්**

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක